**සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය - 2020**

**-------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**--------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**----------------------------**

සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**---------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- මූල්‍ය ප්‍රකාශනවල ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් ඇති හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තකසේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වන හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 55 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.8,949,317 ක් වූ ප්‍රත්‍යාගණන සංචිතය සම්බන්ධයෙන් අධිකාරියේ ගිණුම් ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණු අතර ප්‍රමිතයේ 65 ඡේදය ප්‍රකාරව, වත්කම්වල අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කර නොතිබුණි. මේ අනුව සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු දැනටමත් භාවිතා කරනු ලබන පිරිවැය රු.34,610,524 ක් වූ | 2020 දෙසැම්බර් 31 දිනට වන ප්‍රත්‍යාගණන සංචිතය 2008 වර්ෂයේදී ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමෙන් පසු ඉදිරියට ගෙන ආ ශේෂයක් වන අතර ප්‍රවර්තන වර්ෂයේ ප්‍රත්‍යාගණන සංචිතයේ වෙනස් වීමක් සිදු කර නොමැති බැවින් ගිණුම්කරන ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොමැත. 2021 වර්ෂයේදී ප්‍රත්‍යාගණන සංචිතය සම්බන්ධයෙන් නව ගිණුම්කරන ප්‍රතිපත්තියක් පිළියෙල කර ඒ අනුව කටයුතු කරනු ලැබේ. අධිකාරියේ භාවිතා කරන සියළුම දේපළ, | ප්‍රමිතයේ ප්‍රතිපාදන වලට අනුකූලව ගිණුම් ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වත්කම්වල ඵලදායී ජීවිත කාලය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව නැවත සමාලෝචනය කර ගිණුම්වල ගැලපීමට කටයුතු කර නොතිබුණි. | පිරියත හා උපකරණ තක්සේරු කිරීම සඳහා 2019 වර්ෂයේදී රජයේ තක්සේරු දෙපාර්තුමේන්තුවට භාර දුන්නද ,එම වාර්තා ලැබීම දිගින් දිගටම ප්‍රමාද විය .2021 වර්ෂයේදී රථ වාහන තක්සේරු කිරීමේ වාර්තා පමණක් ලැබී ඇති අතර ඒ අනුව 2021 වර්ෂයේ මෝටර් රථ වත්කම් පන්තිය සඳහා නව තක්සේරු වටිනාකම් ඇතුලත් කල හැකිය. | |
| (ආ) | අධිකාරිය විසින් හා අධිකාරියට එරෙහිව පැවති නඩු 39 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 08 හි 105 සහ 108 ඡේදයන් ප්‍රකාරව ඇතිවිය හැකි අසම්භාව්‍ය වගකීම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම සිදුකර නොතිබුණි. | සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය විසින් පවරා ඇති සියළු නඩු බද්ධ නිවාස අයිතිවාසිකම් පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව හා සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරී පනතේ 25 වන වගන්තිය ප්‍රකාරව අධිකාරියේ නියෝග ක්‍රියාත්මක නොකිරීම සම්බන්ධයෙනි. අධිකාරියේ නියෝගයන්ට විරුද්ධව නඩු පැවරිය හැක්කේ අභියාචනාධිකරණයේ වන බැවින් ඒවා රිට් ආඥාවක් ඉල්ලීමට අදාල නඩුවේ. එවැනි තත්ත්වයක් තුළ අධිකාරිය විසින් පවරන හා අධිකාරියට එරෙහිව පවරන නඩු සම්බන්ධයෙන් අසම්භව්‍ය වගකීමක් නොමැත. | ප්‍රමිතයේ ප්‍රතිපාදන වලට අනුකූල විය යුතු වීම. |
| (ඇ) | 2019 වර්ෂයේ මෘදුකාංග මිලදී ගැනීම සඳහා දරන ලද රු. 950,880 ක මුදල ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 20 ප්‍රකාරව අස්පෘශ්‍ය වත්කම් ලෙස ගිණුම් ගත නොකර පරිගණක වියදම් ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ආදායමට එරෙහිව කපාහැර තිබීම සමාලෝචිත වර්ෂයේදීද නිවැරදි කර නොතිබුණි. | 2021 වර්ෂය සඳහා සකස් කරන ලද වාර්ෂික අයවැය ලේඛනයේ අස්පෘශ්‍ය වත්කම් සඳහා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙනම වැය ශීර්ෂයක් හදුන්වා දී ඇති බැවින් 2021 වර්ෂයේ සිට මෙම වැරැද්ද නිවැරදි වේ. ඉහත දක්වා ඇති වැරැද්ද 2021 වර්ෂයේ පෙර වර්ෂවලට අදාලව නිවැරදි කිරිමට කටයුතු කරනු ලැබේ. | ප්‍රමිතයේ ප්‍රතිපාදන වලට අනුකූලව අස්පෘශ්‍ය වත්කම් වෙනමම හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| "නගමු පුරවර" වැඩසටහන සඳහා මහාභාණ්ඩාගාරයෙන් සහ ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙන් ලැබී තිබුණු රු.1,144,729 ක් දීර්ඝ කාලීන වගකීම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වනු වෙනුවට වසර 05 කට අධික කාලයක සිට ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි. | අධිකාරියේ සාමාන්‍යාධිකාරී විසින් පත්කළ සිව් පුද්ගල කමිටුවක් මගින් තොරතුරු රැස්කර, මෙම මුදලෙන් රු.559,268 ක් රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවට ගෙවිය යුතු බවට හඳුනාගෙන ඇත .ඉතිරි මුදල සම්බන්ධයෙන් විගණන හා කළමනාකරණ කමිටුවේ නිර්දේශ සහිතව අධ්‍යක්ෂ මණ්ඩලයට කරුණු ඉදිරිපත් කර තීරණයක් ගැනීමට නියමිතය. | ගෙවිය යුතු ශේෂ නොපමාව නිරවුල් කර ගැනීමට සහ නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුය. |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂය | මුදල<br>රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- | --- |
| (අ) | ගබඩා භාණ්ඩ වල ශුද්ධ උපලබ්ධි අගය | 1,584,997 | ගණනය කළ ආකාරය පිළිබඳ විස්තර | 2020 වර්ෂයේ තොග සමීක්ෂණය සඳහා පත්කල කමිටුව විසින් දුරකථන ඇමතුම් මගින් විමසීමෙන් වෙළෙඳපල අගය සටහන් කර ඇත. 2021 වර්ෂයේ සිට ලිඛිතව වෙළෙඳපල වටිනාකම් ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. | තොග පිරිවැය තීරණය කිරීමට අදාල ලිඛිත සාක්ෂි ලබා ගැනීම කල යුතුය. |
| (ආ) | පෙර වර්ෂ ගැලපුම් ගිණුමට ගලපන ලද ණය නිරවුල් කිරීමේ විස්තර | 1,386,534 | පෙර වර්ෂ ගැලපුම් ගිණුමට ගැලපීමේ විස්තර | CMA/06/01/256 ලිපිගොනුවෙහි මෙහි දක්වා ඇති ණයගැති ශේෂ සම්බන්ධ සම්පූර්ණ විස්තර අඩංගු වේ. එම ලිපිගොනුව විගණනය සඳහා මේ සමඟ ඉදිරිපත් කරමි. | අදාල ජ'නල් වවුචර සමඟ විස්තර ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

------------------------------

### 1.6.1 ලැබිය යුතු මුදල්

----------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගම්පහ හා මීගමුව රෝහල්වල පොම්පාගාර නඩත්තුව වෙනුවෙන් 2020 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ශේෂය රු.7,393,054 ක් වන අතර අධිකාරියේ විෂය පථය තුල නොමැති මෙම කාර්යය නිරවුල් කර ගැනීමට කටයුතු නොකර ණයගැතියන් ලෙස ගිණුම් ගතකරමින් පැවතුණි. එසේම 2020 දෙසැම්බර් 31 දිනට රු.12,899,599 ක ණයගැති ශේෂය තුල වර්ෂ 05 ට වැඩි කාලයක සිට ඉදිරියට ගෙන එන ලද ණයගැතියන් 12 දෙනෙකුගෙන් ලැබිය යුතු ශේෂය රු.7,370,329 ක් වූ අතර එය මුළු ණයගැතියන්ගෙන් සියයට 57 ක් විය. | ගම්පහ රෝහලේ පොම්පාගාර නඩත්තුවට අදාළ මුදල් ප්‍රමාද වී හෝ ලැබෙමින් පවතී. 2009 හා 2015 වර්ෂවල ගම්පහ රෝහලට යැවූ බිල්පත් විෂයභාර ලිපිකරුගේ අතපසුවීමකින් අස්ථානගතවී ඇති අතර එම බිල්පත් අගය වන රු.මි. 1.1 ක් හිඟව පවතී. ඒ සම්බන්ධයෙන් ලිපිගොනු පරීක්ෂා කර බලා ඉදිරියේදී කඩිනම් පිළිතුරක් ලබා දෙන බව දන්වා ඇත. මීගමුව රෝහලෙන් ලැබීමට ඇති හිඟ මුදල් සම්බන්ධයෙන් ඉදිරියේදී සාකච්ඡාවක් පැවැත්වීමට නියමිතය. සමතකරණයන් සඳහා ලැබිය යුතු හිඟ මුදලේ ශේෂය වන රු.2,529,698 ක මුදල පොත්වලින් ලියා හැරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අමාත්‍යාංශ ලේකම් හරහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිපියක් යවා ඇත. ජල්තර නිවාස ක්‍රමයේ මලජල අපවහන පද්ධතියේ හිඟ විදුලි බිල්පත ගෙවීමට සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය විසින් දරන ලද මුදල් ලබා ගැනීම සම්බන්ධයෙන් ජල්තර නිවාස ක්‍රමයේ ඒකාබද්ධ කළමනාකරණ සංස්ථාව සමග සාකච්ජාවක් පැවැත්වීමට නියමිතය. 2010 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා තාවකාලික සහාධිපත්‍ය සහතිකය ලබාදීමේදී අවසන් සහාධිපත්‍ය සහතිකය වෙනුවෙන් තවදුරටත් සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියට ගෙවියයුතු මුදල ණය ගැතියෙකු වශයෙන් ගිණුම්ගත කිරීම නිසා මෙම ණයගැතියන් බිහිවී ඇත. ඒ සම්බන්ධයෙන් අධ්‍යක්ෂක මණ්ඩලය දැනුවත් කර විධිමත් අනුමැතියක් ලබා ගැනීමෙන් පසු ඉහත ණයගැති | ලැබිය යුතු ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර වත්කම් නිවැරදිව වර්ගීකරණය කර ගිණුම් ගත කල යුතු වීම. |

ශේෂයන් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

-------------------------------------------------------------------------------

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | ------------------------------- | ------------------- | ----------------- | --------------- |
| (අ) | 2003 අංක 24 දරන පොදු පහසුකම් මණ්ඩල (සංශෝධන) පනතේ 5 ඡේදයේ (ඌ) වගන්තිය | සහාධිපත්‍ය දේපළවල පොදු පහසුකම් නඩත්තු කිරීම සඳහා පළාත් පාලන ආයතන වෙත පැවරීම අධිකාරියේ අරමුණක් වුවද මාළිගාවත්ත සහ ජල්තර නිවාස ක්‍රමවල පොදු පහසුකම් පළාත් පාලන ආයතන වෙත පවරා නොතිබුණි. | 2003 අංක 24 දරන පොදු පහසුකම් මණ්ඩල සංශෝධන) පනතේ 5 ඡේදයේ (උ) වගන්තිය අනුව සහාධිපත්‍ය දේපළවල පොදු පහසුකම් නඩත්තු කිරීමට කළමනාකරණ සංස්ථාව අපොහොසත් වන්නේ නම් පමණක් ඒ සඳහා සෘජුව මැදිහත්වීමටද පනතේ 5 ඡේදයේ (ඌ) වගන්තිය අනුව ඒවැනි සහාධිපත්‍ය දේපළ පළාත් පාලන ආයතන වෙත බාරදීමට කටයුතු කිරීමද සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ අරමුණු ලෙස දක්වා ඇත. මාලිහාවත්ත හෝ ජල්තර නිවාස ක්‍රමවල කළමනාකරණ සංස්ථා වලින් ඒවැනි ඉල්ලීම් මේ වන තෙක් සිදු කර නොමැති බැවින් අධිකාරිය මේ සම්බන්ධව කටයුතු කර නොමැත. | යොමුගත පනතේ නීතිරීති වලට අනුකූල විය යුතු වීම. |
| (ආ) | 2006 අංක 12 දරන මුද්දර බදු (විශේෂ විධිවිධාන) පනත | (i) රු. 25,000 කට වැඩි යම් මුදලක් නිදහස් කිරීමේදී රු. 25 ක මුද්දර ගාස්තු අයකළ යුතු වුවත්, අධිකාරියේ ගෙවීම් වවුචර් පරීක්ෂාවේදී රු.1,092,341 ක් වටිනාකමැති ගෙවීම් 16 ක් සඳහා අදාළ | ඉදිරියේදී රු. 25,000 ට වැඩි සෑම ගෙවීමක් සඳහාම රු. 25 ක මුද්දර ගාස්තුවක් අය කරන ලෙස වවුචර් පිළියෙල කරන කළමනාකරණ සහකරුට ලිඛිතව දැනුම් දී ඇත. | යොමුගත පනතේ නීතිරීති වලට අනුකූලව මුද්දර ගාස්තු අයකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මුද්දර ගාස්තුව අයකිරීමට කටයුතු කර නොතිබුණි. | | |
| | (ii) අධිකාරියේ රු.789,800 ක් වටිනාකමැති ආපදා ණය මුදල් ගෙවීමේ අවස්ථා 16 ක ලිපි හුවමාරුවේදී භාවිතා කළ මුද්දර නැවත භාවිතා කර තිබුණි. | අවලංගු කල මුද්දර ගැසූ සියලු සේවකයින්ගෙන් හා චෙක්පත් නිකුත් කළ කළමනාකරණ සහකාරවරියගෙන් නිදහසට කරුණු විමසීමට කටයුතු කර ඇත. ඒ අනුව ඔවුනට තරයේ අවවාද කර මින් ඉදිරියට මෙවැනි දේ නොකිරීමට වග බලාගන්නා ලෙස උපදෙස් ලබා දීමට කටයුතු කරනු ලැබේ. | යොමුගත පනතේ නීතිරීති වලට අනුකූලව මුද්දර ගාස්තු අයකළ යුතුය. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| (i) II වන පරිච්ඡේදයේ 1.10.1 සහ අධිකාරියේ බඳවා ගැනීමේ පරිපාටියේ 8.3 ඡේදය | ප්‍රසිද්ධ දැන්වීම් පලකිරීම හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ වලින් තොරව 2017 හා 2018 වර්ෂයන්හි සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්), පාරිභෝගික සේවා නිලධාරී හා පරිපාලන නිලධාරී යන තනතුරු තුන සඳහා නිලධාරීන් සහ 2019 වර්ෂයේ තනතුරු 05 ක් සඳහා සේවකයින් 14 දෙනෙකු බඳවා ගෙන තිබුණි. ආයතන සංග්‍රහයේ පරිච්ඡේද 1:10:1 ට අනුකූලව අදාල අනුමැතීන් ලබා නොගෙන අධිකාරියේ සභාපති විසින් 2019 වර්ෂයේදී යථෝක්ත සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්) ගේ තනතුර 2013 වර්ෂය දක්වා පෙරදාතම් කර තිබුණි. | විගණන හා කළමනාකරණ කමිටුවේ නිර්දේශය පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදි. එහිදී මූලික පරීක්ෂණයක් පැවැත්වීමට තීරණය කල අතර, අදාල වාර්තාව සභාපතිවරයා වෙත ලබාදී ඇත. ඊලග අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම සඳහා එම වාර්තාව ඉදිරිපත් කිරීමට නියමිතය. | යොමුගත නීතිරීති වලට අනුකූලව බඳවා ගැනීම් සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 13:1 ඡේදය සහ 13:2 ඡේදය | කිසියම් විෂමාචාරයක් සම්බන්ධ සිදුවීමක් පිළිබඳව මූලික විමර්ශණයක් පැවැත්වීමට නියෝග කරන බලධරයෙකු විසින් ඒ ඒ සිදුවීමේ ස්වභාවය සැලකිල්ලට ගෙන මූලික විමර්ශනය කොතරම් කාලයක් ඇතුළත නිමකල යුතුද යන්න නියෝගය නිකුත් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය තුල සිදුකර තිබූ අධිකාරියේ සේවකයින් 07 දෙනෙකු සඳහා අවස්ථා 10 කදී ගොනුකර තිබුණු විවිධ චෝදනා සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. විෂමාචාරය පිළිබඳව තමන් විසින් සොයාගත් කරුණු පිළිබඳව අප්‍රමාදව තම නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කිරීම මූලික විමර්ශන නිලධරයෙකු හෝ නිලධර කමිටුවක් හෝ විසින් ඉටුකල යුතු මූලික කාර්යයක් වුවද සමාලෝචිත වර්ෂයේ සිදුවූ සිද්ධීන් 05 ක් සම්බන්ධයෙන් 2021 අප්‍රේල් 30 දින වන විටත් අදාල සිද්ධීන් සම්බන්ධව නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි. | මූලික විමර්ශනයක් පැවැත්වීම සඳහා නියෝග කරන විට මූලික විමර්ශන නිලධාරීන්ට අදාල මූලික විමර්ශනය හැකි ඉක්මනින් අවසන් කළයුතු බවට සඳහන් කර පත්වීම් ලිපි නිකුත්කර ඇත.මූලික විමර්ශන නිලධාරින් හට පැවරි ඇති වෙනත් විමර්ශන රාජකාරි කටයුතු හේතුවෙන් රාජකාරි බහුලත්වය මත නිලධාරීන්ගේ ප්‍රකාශ ලබාගැනිම් වලින් පසු කඩිනමින් අවසන් වාර්ථා නිකුත් කිරිමට නොහැකි වී ඇත. ඉදිරියේ දී මූලික විමර්ශන පරීක්ෂණ සිදුකිරීමට අදාළ මූලික විමර්ශන යේ ස්වභාවය අනුව වාර්ථාව ලබා දියයුතු කාල සීමාව නිශ්චිතව නියම කර පත්වීම් ලිපි නිකුත් කිරීමට ක්‍රියා කරනු ලබයි. | යොමුගත නීතිරීති වලට අනුකූල විය යුතු වීම. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මු.රෙ.218 | එකම ගෙවීමක් සම්බන්ධයෙන් දෙවරක් මුදල් ගෙවීම වැලැක්වීම සඳහා විශේෂ පියවර ගතයුතු වුවත් සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ බිල්පත් | ගෙවීම් සනාථ කෙරෙන ලේඛණවල මුල් පිටපත අදාළ ගෙවීම් වවුචරයෙහි ඇමිණීමට අදාළ විෂය භාර කළමනාකරණ සහකරුට උපදෙස් ලබා දී ඇත. | යොමුගත රෙගුලාසියට අනුකූලව අභ්‍යන්තර පාලනය ශක්තිමත් වන පරිදි කටයුතු |

| | | | | |
|---|---|---|---|---|
| | | පියවීම සඳහා රු. 2,298,748 ක ගෙවීම් වවුචර් සමඟ ඡායාස්ථ බිල්පත් අමුණා තිබුණු අතර ඒ පිළිබඳ නොසලකා ගෙවීම් කර තිබුණි. | | කර ගෙවීම් සිදු කළ යුතුය. |
| (ii) | මු.රෙ.231 | හැකිතාක් දුරට වෙනත් ලේඛනයක් නොබලා හරිවැරදි බැලීමට හැකිවන පරිදි සම්පූර්ණ විස්තර වවුචර් වල අඩංගු විය යුතු වුවද, නියැදි පරීක්ෂාවේදී රු.60,101,890 ක ගෙවීම් සඳහා සනාථ කෙරෙන ලේඛන වවුචරය සමග ඉදිරිපත් කර නොතිබුණි. | 2021 වර්ෂයේ සිට බිල්පත්වල මුල් පිටපත් අදාළ ගෙවීම් වවුචරය සමඟ ඇමිණීමටත් ඒ බව වවුචරයේ මුහුණත සඳහන් කරන ලෙසටත් අදාළ විෂය භාර කළමනාකරණ සහකරු වෙත ලිඛිතව දැනුම් දී ඇත. | යොමුගත රෙගුලාසියට අනුකූලව ගෙවීම් වලට අදාල උපයෝගී ලියවිලි ලබාගැනීමට කටයුතු කළ යුතුය. |
| (iii) | මු.රෙ.502 (2) | අධිකාරිය සතු රු.96,409,808 ක් වූ දේපල, පිරියත හා උපකරණ සම්බන්ධයෙන් පොදු 287 ආකෘතියේ ස්ථාවර වත්කම් ලේඛනය පවත්වාගෙන ගොස් නොතිබුණි. වාර්ෂික එකතුවන වත්කම් සඳහා ලේඛනයක් පවත්වාගෙන ගියද විධිමත්ව යාවත්කාලීන කර නොතිබුණු අතර, වාර්ෂිකව විගණනය සඳහා ඉදිරිපත් කරන ලද තොරතුරු අතර විචලනයන් නිරීක්ෂණය විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ ක්ෂය ගණනය කිරීමේ වෙනස රු. 177,578 ක් වී තිබුණි. | 2021 වර්ෂයේ සිට මු.රෙ. 502 (2) ප්‍රකාරව පොදු 287 ආකෘතිය අනුව ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීන කිරීමට කටයුතු කර ඇත. එබැවින් සියළුම වත්කම් පංති සම්බන්ධයෙන් නිවැරදි ක්ෂය කිරීමක් 2021 වර්ෂයේ සිට සිදුකිරීමට අපේක්ෂිතය. තවද සමාලෝචිත වර්ෂයේ ක්ෂය ගණනය කිරීමේ විචලනයද 2021 වර්ෂයේ පෙර වර්ෂවලට අදාල ගැලපීම් යටතේ නිවැරදි කරනු ලැබේ. | වත්කම් වල පාලනය ශක්තිමත් වන පරිදි වත්කම් ලේඛන පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. |
| (iv) | මු.රෙ.757(2) | ඌනතා හා නැතිවීම් කිසිවක් වෙතොත් ගණන්දීමේ නිලධාරියා විසින් ඒවා සම්බන්ධයෙන් ක්‍රියාකල යුතු වුවත්, අධිකාරියේ | මේ සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන පරීක්ෂණයක් සිදු කර වාර්තාවක් ඉදිරිපත් කිරීමට නියමිතය. | යොමුගත රෙගුලාසිය ප්‍රකාරව භාණ්ඩ ඌනතා සම්බන්ධව කටයුතු කළ |

| | | | | |
|---|---|---|---|---|
| | | 2020 දෙසැම්බර් 31 දිනට සිදුකල භාණ්ඩ සමීක්ෂණයේදී හඳුනාගත් රු.425,221ක් වටිනාකමැති ස්ථාවර වත්කම් 12 ක් සම්බන්ධයෙන් එලෙස කටයුතු කර නොතිබුණි. | | යුතුය. |
| (ඉ) | 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මු.රෙ.371(5) | අතුරු අග්‍රිමයක් නිකුත් කිරීමෙන් පසු අදාළ කාර්ය අවසන් කර දින 10 ක් ඇතුළත එම අතුරු අග්‍රිමය ගිණුම් අංශය වෙත නැවත පියවිය යුතු වුවත් අධිකාරියේ අවස්ථා 09 කදී රු. 315,500 ක් වූ අග්‍රිම දින 16 සිට දින 115 දක්වා ප්‍රමාදයකින් පසුව පියවා තිබුණි. | 2020 මාර්තු මස සිට ජුනි මස දක්වා රට තුළ ව්‍යාප්තව තිබූ Covid – 19 වසංගතය හේතුවෙන් නිරෝධායන ඇඳිරිනීතිය පනවා තිබීම නිසා කාර්යාලය වසා තැබීමෙන් මෙම අග්‍රිම පියවීමට ප්‍රමාද වී ඇත. කෙසේ වුවද විශේෂ අත්තිකාරම් මාණ්ඩලික නිළධාරින්ට පමණක් ලබා දෙන අතර අත්තිකාරම් මුදල් ලබා ගෙන දින 10 ක් ගතවන විට ඔවුන් වාචිකව දැනුවත් කිරීමද නැතහොත් වැටුපෙන් අය කිරීමද සිදු කරනු ලැබේ. | අත්තිකාරම් මගින් ගෙවීම් කිරීම් විධිමත් කළ යුතුය. |
| (ඊ) | 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | | |
| | (i) 6.5.1 ඡේදය සහ 6.5.3 ඡේදය | පාලක මණ්ඩලය විසින් අනුමත කළ කෙටුම්පත් වාර්ෂික වාර්තාව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් තුල විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණු අතර, 6.5.3 ඡේදය ප්‍රකාරව අධිකාරිය විසින් 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා විගණන වාර්තා ඇතුළත් වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | කෙටුම්පත් වාර්ෂික වාර්තාව 2021 මාර්තු 31 දින රජයේ විගණන අංශයට යොමු කර ඇත. 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වාර්ෂික වාර්තා සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. ඒ අනුව අමාත්‍ය මණ්ඩල කාර්යාලය මගින් අදාල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තු සභාගත කිරීමට අවශ්‍ය කටයුතු කරන මෙන් අමාත්‍යාංශ ලේකම්ට | අමාත්‍යාංශය හා එක්ව වාර්ෂික වාර්තා නියමිත කාලය තුල පාර්ලිමේන්තුවේ සභාගත කරීමට කටයුතු කළ යුතුය.එසේම මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය |

| | | | | |
|---|---|---|---|---|
| | | | දැනුම් දී ඇත. | |
| (ii) | 8.2.2 ඡේදය හා 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය | රාජ්‍ය සංස්ථාවක අතිරේක අරමුදල්, ආයෝජනය කිරීම සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය යටතේ ආයෝජනය කළයුතු වුවත් අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේ ආයෝජනය කරන ලද රු.181,171,713ක් වූ විවිධ තැන්පතු 8 ක් සම්බන්ධයෙන් අදාල අනුමැතිය ලබාගෙන නොතිබුණි. | සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියට කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ඉඩමක් මිලදී ගැනීමේ අරමුණින් මෙම අරමුදල් කෙටිකාලීන තැන්පතු ලෙස රඳවා ගෙන ඇත. මේ සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා දනුවත් කර ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | අදාල ආයෝජන සම්බන්ධව මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය හා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඵ) | 2016 මාර්තු 03 දිනැති හා 2/1/13/332 අංක දරන නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය | යොමුගත ලිපිය මගින් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට අනුමැතිය ලබාදිය නොහැකි බවත් අනුමත බඳවා ගැනීමේ පරිපාටියට අනුකූලව බඳවා ගැනීම් සිදුකලයුතු බවත් දන්වා තිබුණු නමුත් අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය සලකා බැලීමකින් තොරව සහකාර සාමාන්‍යාධිකාරී (මානව සම්පත්) තනතුරට 2016 පෙබරවාරි 25 දින වසරක කොන්ත්‍රාත් කාලයකටද 2017 නොවැම්බර් 27 දින සිට වසර 03 ක පරිවාස කාලයකට යටත්ව ස්ථිර තනතුරකට ද පත්වීම් ලබාදී තිබුණි. | එවකට ආයතනයේ පත්වීම් බලධාරියා සභාපතිතුමා බැවින් ඒ අවස්ථාවේදී පැවති සහකාර සාමාන්‍යාධිකාරි (මානව සම්පත්) පුරප්පාඩුවේ අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන එවකට වැඩ බලන සාමාන්‍යාධිකාරිගේ නිර්දේශ මත පත්වීම් බලධාරියා විසින් මෙම පත්වීම සිදුකර ඇත. | අමාත්‍යාංශ නියෝග හා අනෙකුත් නීතිරීති වලට අනුකූලව බඳවා ගැනීම් සම්බන්ධව කටයුතු කල යුතුය. |
| (ඔ) | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක PE/1/CMA/4/11(i) හා 2019 සැප්තැම්බර් 09 දිනැති ලිපිය | 2018 මූල්‍ය වර්ෂයේ බදු පසු ලාභයෙන් රු.මිලියන 47 ක් (සියයට 33 1/3) ක් හා 2019 වර්ෂයේ සිට බදු පසු ලාභයෙන් සියයට 33 1/3 ක් අයබදු වශයෙන් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීමට නියම කර ඇතත්, | බත්තරමුල්ල ප්‍රදේශය කේන්ද්‍ර කරගෙන ඉඩමක් මිලදී ගෙන අධිකාරිය සඳහා කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීමට ප්‍රතිපාදන අවශ්‍යව ඇත. සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය | යොමුගත නීතිරීති වලට අනුකූල විය යුතුය. |

| | | |
|---|---|---|
| | ඒ අනුව කටයුතු කර නොතිබුණි. | එදිනෙදා වියදම් සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන නොලබන බැවින් වාර්ෂිකව උපයා ගන්නා ලාභය මේ සඳහා යොදවා ගැනීමට අපේක්ෂිතය. කෙසේ නමුදු මේ සඳහා මුදල් අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීමට අපේක්ෂා කෙරේ. |

**1.8** **මුදල් කළමනාකරණය**

--------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු. 3,000,000 ක් වූ නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ ආයෝජිත අරමුදල් වෙනුවෙන් ආයෝජන ආදායම් ලැබී නොතිබුණි. | 2021 ජනවාරි 21 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ කොටස් විකිණීම සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී. ඒ අනුව කොටස් විකිණීම සඳහා අනුමැතිය ලබා ගැනීමට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ජනරාල් වෙත යොමු කර ඇති අතර ඒ අනුව නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ සභාපති වෙත පිළිතුරු ලිපිය සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියට පිටපතක් සහිතව එවා ඇත. 2020 වර්ෂයේදි ලාභාංශ සම්බන්ධයෙන් නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවෙන් විමසීමක් සිදු කල අතර 2019 වර්ෂයේ අලාභ තත්ත්වයක පවතින බැවින් ලාභාංශ නිකුත් කිරීමේ හැකියාවක් නොමැති බව දන්වන ලදී. | ආයෝජන සඳහා ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

--------------------

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

-------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 32,963,656 අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 18,186,738 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.14,776,918 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට මෙහෙයුම් ආදායම රු. 14,191,566 කින් ඉහල යාම සහ මෙහෙයුම් වියදම රු. 1,898,229 කින් පහලයාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරියේ කාර්යාලය පවත්වාගෙන යන ගොඩනැගිලි පරිශ්‍රය සඳහා වාර්ෂිකව රු.4,460,772 බැගින් කුලී වියදම් හා වාර්ෂික නඩත්තු වියදම් පිළිවෙලින් 2019 හා 2020 වර්ෂයන්හි රු.4,593,220 ක් හා රු.1,434,114 බැගින් වියදම් කර තිබුණද විධිමත් ගිවිසුමකට එළඹී නොතිබුණි. | ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් මාසික බදු කුලිය රු.404,055 සිට රු.700,000 දක්වා වැඩි කිරීමත් 2020 ජනවාරි සිට හිඟ මුදල් එකවර ගෙවන ලෙසත් දන්වන ලදී. ඒ අනුව වැඩි කරන ලද මාසික බදු කුලිය වන රු.700,000 ගෙවීමට සභාධිපතා කළමනාකරණ අධිකාරිය එකඟ වුවද 2020 ජනවාරි සිට රු.මි. 7.7 ක හිඟ මුදලක් එකවර ගෙවීම ගැටළු සහගත තත්වයක් බැවින් සහ ඒ සම්බන්ධයෙන් මෙතෙක් අවසන් තීරණයක් ගෙන නොමැති බැවින් ගිවිසුම අත්සන් කිරීම ප්‍රමාද වී ඇත. තවද, අළුත්වැඩියාවන් සඳහා වැය වූ මුදල මාසික කුලියෙන් අයකිරීමට අනුමැතිය ඉල්ලා ගරු අග්‍රාමාත්‍ය වෙත ලිපියක් යවා ඇති අතර ඒ සඳහා පිළිතුරු ලැබී ඇත. | අධිකාරිය වෙනමම නීතිමය පුද්ගලභාවයක් සහිත ආයතනයක් බැවින් අධිකාරිය නමින් ගිවිසුම් ඇතිකර ගැනීමට කටයුතු කල යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පසුගිය වර්ෂ කිහිපයක ඉලක්කගත දිනයන් සහිතව ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබුණු 1973 අංක 10 දරන පොදු පහසුකම් මණ්ඩල පනතේ සංශෝධන කටයුතු සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මටද<br><br>ඇතුලත් කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා මේ සම්බන්ධව කිසිදු ප්‍රගතියක් ලබාගෙන නොතිබුණි. 2019 දෙසැම්බර් 16 දින නීති කෙටුම්පත් සම්පාදන දෙපාර්තමේන්තුව විසින් එවන ලද ලිපිය අනුව නව අමාත්‍ය මණ්ඩලයෙන් | 1973 අංක 10 දරන සභාධිපතා කළමනාකරණ අධිකාරි පනතට හා 1973 අංක 11 දරන බද්ධ නිවාස අයිතිකම් පනතට අදාල සංශෝධන සභාධිපතා කළමනාකරණ අධිකාරිය විසින් 2017 ජුනි 30 දින නීති කෙටුම්පත් දෙපාර්තුමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදි. ඒ අනුව අදාල සංශෝධන ඇතුලත් කරමින් නීති කෙටුම්පත් දෙපාර්තුමේන්තුව විසින් එවා තිබූ මූලික කෙටුම්පතට අදාලව නැවත සංශෝධනය විය යුතු කරුණු පිළිබඳව නීති කෙටුම්පත් දෙපාර්තුමේන්තුව වෙත නැවත දන්වා යවා ඇත. 2019 දෙසැම්බර් 16 වන දින නීති කෙටුම්පත් දෙපාර්තුමේන්තුව විසින් දන්වා ඇත්තේ මෙම සංශෝධන, පත්වූ නව අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර අනුමැතිය ලබාගන්නා ලෙසයි. ඒ අනුව | සැලසුම්ගත ඉලක්කයන් ළඟා කර ගැනීමට කටයුතු කල යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | මේ සඳහා අනුමැතිය ලබා ගන්නා ලෙස දක්වා තිබුණ ද අදාළ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලද අතර, අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි මෙම සංශෝධන නැවත සලකා බැලීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුකමිටුවක් පත් කරන ලදි. එකී අමාත්‍ය මණ්ඩල අනුකමිටුව විසින් 2020 නොවැම්බර් 10 දිනැති නිර්දේශ අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති අතර ඒ අනුව ඉහතකී පනත් වලට අදාල සංශෝධන නැවත සලකා බැලීම සඳහා විද්වත් කමිටුවක් පත් කර ඇත. ඒකී විද්වත් කමිටුව සඳහා කමිටු සාමාජිකයන් මේ වන විටත් නම් කර ඇති අතර, එම කමිටුව ඉදිරියේදී රැස්වීමට නියමිතය. | |

### 3.3 වාහන පද්ධතිය කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරිය විසින් 2011 වර්ෂයේදී මිලදීගත් රු.5,890,000 ක් වූ මෝටර් රථයක් සමාලෝචිත වර්ෂයේදී එම වටිනාකමටම රක්ෂණය කර තිබූ අතර මිලදී ගත් වර්ෂයේ සිට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) වෙත අනුයුක්ත කර තිබුණි. 2012 වර්ෂයේ සිට 2021 වර්ෂයේ ජනවාරි දක්වා අනතුරු 16ක් සිදුව තිබූ අතර අවස්ථා 02 කදී පමණක් මු.රෙ.104 (3) හා 104(4) ප්‍රකාරව කටයුතු කර තිබුණි. අනතුරු 13 ක් සඳහා රු.1,682,160 ක් වූ වන්දි රක්ෂණ ලබාගෙන තිබුණද එම තොරතුරු අදාල ලිපිගොනුවල ඇතුලත් කර නොතිබුණි. අදාල නිලධාරියා විසින් මෙම රථය ධාවනය කර තිබුණද ඒ සඳහා නිසි අනුමැතියක් ලබාගෙන නොතිබුණි. | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි මුදල් විසින් මෝටර් රථය ධාවනය කිරීම සඳහා අදාල කාල පරිච්ජේදය තුල අනුමැතියක් ලබා නොගෙන තිබු අතර වර්තමානයේ අධිකාරියේ ජ්‍යෙෂ්ඨ නිළධාරින් සඳහා අනුයුක්ත කර ඇති වාහන සඳහා අදාල නිළධාරින් විසින් ධාවනය කිරීමට අවශ්‍ය අනුමැතිය ලබා ගෙන ඇති බව වැඩි දුරටත් සඳහන් කරමි. | වාහන පද්ධතිය කළමනාකරණය හා භාවිතය අදාල නීතිරීති වලට අනුකූලව සිදු කල යුතුය. |
| (ආ) | ඉහත සඳහන් මෝටර් රථය 2019 ඔක්තෝබර් 01 දින අනතුරකට ලක්ව තිබුණද, පොලිස් වාර්තා, කාර්මික වාර්තාවක් නොමැතිව සහ අධිකාරියේ අළුත්වැඩියා සම්බන්ධව පවත්නා අභ්‍යන්තර පාලන පද්ධතියෙන් බැහැරව කටයුතු කර තිබුණි. අළුත්වැඩියා | අනතුර සම්බන්ධ මූලික පරීක්ෂණයෙන් අනතුරුව (මු.රෙ.104) විධිමත් පරීක්ෂණයක් සිදු කරමින් පවතින අතර ඊට අනුකූලව ලබා දෙනු ලබන නියෝග අනුව පියවර ගැනීමට කටයුතු කරමි. මෙම රථය ගරාජයෙන් ලබා ගැනීමට ඔවුන් සමඟ සාකච්ඡා කරමින් පවතී. | වාහන පද්ධතිය කළමනාකරණය හා භාවිතය අදාල නීතිරීති වලට අනුකූලව සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කටයුතු කළ පෞද්ගලික ගරාජයෙන් අධිකාරිය වෙත රු. 570,295 ක් වූ ඉන්වොයිසියක්ද, රක්ෂණ සංස්ථාවට රු. 251,350 ක් බිල්පත්ද වශයෙන් එකිනෙකට වෙනස් අගයන් සහිතව ඉදිරිපත් කර තිබුණි. රක්ෂණ සංස්ථාවෙන් ලැබුණු වන්දි මුදල රු. 144,019 ක් පමණක් විය. අළුත්වැඩියා කටයුතු අවසන් කල බවට 2019 දෙසැම්බර් 23 ගරාජය මගින් දන්වා තිබුණද 2020 දෙසැම්බර් 31 දක්වා එම රථය අධිකාරිය වෙත ගෙන ඒමට කටයුතු කර නොතිබුණි. | | |
| (ඇ) | 2019 දෙසැම්බර් 19 දින අධිකාරිය සතු මෝටර් රථයකට සිදුවූ අනතුරක් සම්බන්ධයෙන් පොලිස් වාර්තාවක් ලබාගෙන තිබුණද එය ලොග් සටහන් පොතෙහි සටහන් කර නොතිබුණි. රියදුරු විසින් දක්වා තිබූ ආකාරයට එවැනි අනතුරක් සිදුවූ බවට රක්ෂණ ආයතනය දැනුවත් වී නොතිබුණු අතර රු. 2,764,012 ක් වූ අළුත්වැඩියා ඇස්තමේන්තුවක් වෙනුවෙන් රු.500,000 ක හානිපූර්ණයක් පමණක් කිරීමට රක්ෂණ ආයතනය එකඟව තිබුණි. මෙම වාහනය 2020 ජනවාරි 01 දින සිට 2021 ජූනි 30 දක්වා මෝටර් රථ නියෝජිත ආයතනයෙහි ගාල්කර තිබූ නමුත් කිසිදු අළුත්වැඩියාවක් සිදුකර නොතිබුණි. | අදාල මෝටර් රථය නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (නියාමන) වැ.බ හට අනුයුක්ත කර ඇති නිල රාජකාරි වාහනය බැවින් ගේට්ටුවෙන් පිටවීම හෝ පැමිණීම ආරක්ෂක අංශ විසින් සටහන් නොකරන අතර ඔහුන් හට අමාත්‍යංශ අනුමැතිය සහිතව ඉන්ධන දීමනා ගෙවනු ලබයි. තවද මෙම රාජකාරි ලබා ගත් ලිඛිත අනුමැතියක් හෝ බැහැරයාමේ සටහනක් හෝ රාජකාරි කටයුතු සඳහා ලිඛිත අනුමැතියක් ලබා ගැනීමට අධිකාරියේ සේවයේ නියුතු ජෝෂ්ඨ නිළධාරින් විසින් අනුගමනය නොකරනු ලබයි. | වාහන පද්ධතිය කළමනාකරණය හා භාවිතය අදාල නීතිරීති වලට අනුකූලව සිදු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජූනි 02 දිනැති පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.1.3 ඡේදය ප්‍රකාරව පාලක මණ්ඩලය අනුමත කරන ලද සංශෝධිත අයවැය අදාළ වර්ෂය ආරම්භවීමට දින 15 කට පෙර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව, භාණ්ඩාගාරය, අදාළ අමාත්‍යාංශය හා විගණකාධිපති වෙත ඉදිරිපත්කළ යුතු වුවත්, අධිකාරිය විසින් 2020 වර්ෂයේ සංශෝධිත අයවැය සඳහා පමණක් පාලක මණ්ඩලය අනුමතියඅදාල වර්ෂය අවසානයේදී එනම් 2020 නොවැම්බර් 23 දින ලබා ගෙන තිබුණි.. | 2019 වර්ෂයේ අග භාගයේදී දේශපාලන අධිකාරිය වෙනස්වීම හේතුවෙන් සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය පත්කිරීම ප්‍රමාද වීම නිසා 2020 වාර්ෂික අය වැය සමාලෝචිත වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව, භාණ්ඩාගාරය, අමාත්‍යාංශය හා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට නොහැකි විය. කෙසේ වෙතත් අධ්‍යක්ෂ මණ්ඩලයේ ආවරණ අනුමැතියට යටත්ව 2020 ජනවාරි 22 දින 2020 වාර්ෂික අය වැය ඉහත සඳහන් ආයතන වෙත යවා ඇත. කෙසේ නමුත් 2020 නොවැම්බර් 23 දින අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇත්තේ සංශෝධිත අයවැය සඳහාය . | මනා අයවැය පාලනයක් සහිතව කටයුතු කල හැකි වන පරිදි අයවැය ලේඛනය නියමිත පරිදි අනුමත කර ගැනීමට කටයුතු කල යුතුය. |